# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

### 2024 ඔක්තෝබර්/ නොවැම්බර්

### සමාජීය විද්‍යා පීඨය

### ජනසන්නිවේදනය

(අධ්‍යයන වර්ෂ 2007 සිට 2016 දක්වා)

### සන්නිවේදන අධ්‍යයන මූලධර්ම MACO – E1015

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

1. සන්නිවේදනය යනු සංකීර්ණ ක්‍රියාවලියකි. විවිධ නිර්වචන ඇසුරින් පැහැදිලි කරන්න.

2. සන්නිවේදන ක්‍රියාවලියේදී මූලිකාංග ක්‍රියාත්මක වන ආකාරය සන්නිවේදකයා, ආකේතකරණය, නාලිකාව හා ග්‍රාහකයා ට විශේෂිතව උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

3. වාචික සන්නිවේදනයේ ප්‍රබලතාව විවිධ සමාජ සන්නිවේදන අවස්ථා උදාහරණයට ගනිමින් විස්තර කරන්න.

4. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ගේ සන්නිවේදන ආකෘතිය ඇසුරින් සන්නිවේදනයේ "බලපෑම" සිදුවන ආකාරය විස්තර කරන්න.

5. සමූහ සන්නිවේදනයේ විශේෂතා පැහැදිලි කර එය පොදු අරමුණු ඉටුකර ගැනීමෙහි ලා උපයෝගී වන ආකාරය උදාහරණ දක්වමින් විස්තර කරන්න.

6. සමාජ වගකීම් සන්නිවේදන සංකල්පය, නූතන මාධ්‍ය ක්‍රියාකාරිත්වය ඇසුරින් සාකච්ඡා කරන්න.

7. මාධ්‍ය මඟින් ලබා ගන්නා සංදේශ නිවැරදිව ග්‍රහණය කර ගැනීමට නම් මාධ්‍ය සාක්ෂරතාව පැවතීම අත්‍යවශ්‍ය වේ. සමකාලීන මාධ්‍ය ක්‍රියාකාරිත්වය ඇසුරෙන් විමසන්න.

8. මාතෘකා හතරක් (04) යටතේ කෙටි සටහන් ලියන්න.
   - I. අවිධිමත් සන්නිවේදනය
   - II. ජනමාධ්‍ය කාර්යභාරය
   - III. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
   - IV. දොරටුපාල ක්‍රියාවලිය
   - V. අධිපතිවාදී සන්නිවේදන සංකල්පය
   - VI. දෙපියවර ගලනය